මාධ්‍ය නිවේදනය
ஊடக வெளியீடு
Press Release

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

අංකය / எண் / No. CEB/2024/MR/015

දිනය / திகதி / Date 2024 දෙසැම්බර් 19

සියලුම විද්‍යුත්, මුද්‍රිත වෙබ් පදනම් කරගත් මාධ්‍ය ආයතන,
ප්‍රධාන සංස්කාරක / ප්‍රවෘත්ති සංස්කාරක
අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමණාකරු, වෙබ් සංස්කාරක,

හිතවත් මහත්මයාණෙනි/ මහත්මියණි,

## ආසියානු සංවධර්න බැංකුවෙන් ලංවිම ව්‍යාපෘති වලට ඩොලර් මිලියන 150 ක ණයක්

ආසියානු සංවධර්න බැංකුව විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත පසුගිය නොවැම්බර් මාසයේදී අනුමත කල ඩොලර් මිලියන 150 ක ණය මුදල සඳහා ගිවිසුම් අත්සන් කිරීම 2024 දෙසැම්බර් මස 19 වෙනි දින සිදුකරනු ලැබීය. මෙම ණය මුදල ශ්‍රී ලංකා රජය හරහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා ගැනීම සඳහා මූලික සාකච්චා පසුගිය ඔක්තෝබර් මාසයේදී සිදුකරනු ලැබීය.

මෙම ව්‍යාපෘති හරහා අප රටේ විදුලි පද්ධතියේ ස්ථායිතාවය වැඩිදියුණු කිරීම සඳහා අත්‍යාවශ්‍ය ව්‍යාපෘති ගණනාවක් සිදුකිරීමට සැලසුම් කර ඇත. තවද ඉදිරියේදී අප රට තුල ඉදිකිරීමට නියමිත විශාල ප්‍රමාණයේ පුනජර්නනීය ව්‍යපෘති පද්ධතිය වෙත එක්කර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ව්‍යාපෘති ගණනාවක්ද මෙම ණය මුදල හරහා ඉදිකිරීමට නියමිතව ඇත.

**ව්‍යාපෘති සාරාංශය පහත දැක්වේ**

- නව ග්‍රිඩ් උපපොළවල් 6 ක් ඉදිකිරීම
- 87 km දිග ද. වො. 132 සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ඉදිකිරීම
- 45 km දිග ද. වො. 220 සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ඉදිකිරීම
- දැනට පවතින ග්‍රිඩ් උපපොළවල් දෙකක ධාරිතාව වැඩි කිරීම

ලංකා විදුලිබල මණ්ඩලය හා එහි අනුබද්ධිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, මිලියන 7.5 ක් වු පාරිභෝගික සංඛ්‍යාවකට විදුලිය බෙදා හරියි. බෙදාහැරීම් පද්ධතිය හා විදුලි බලාගාර සම්බන්ධ කරන ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ ජාලය කිමි 3400 ක් වු සම්ප්‍රේෂණ රැහැන් මාර්ග හා ග්‍රිඩ් උපපොළ 90 කින් සමන්විත වේ.

මෙයට විශ්වාසී,
**ලංකා විදුලිබල මණ්ඩලය**

ඉංජිනේරු. A.D.K. පරාක්‍රමසිංහ
මාධ්‍ය ප්‍රකාශක

මාධ්‍ය අංශය, ලංකා විදුලිබල මණ්ඩලය,
නො. 50, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 00200, ශ්‍රී ලංකාව
e : media@ceb.lk